# ස්ථිර පැවැත්ම

## සඳහා

# මග පෙන්වීම්

Sinhali

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بسلطانة
تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد
THE COOPERATIVE OFFICE FOR CALL & FOREIGNERS GUIDANCE AT SULTANAH

# وسائل الثبات

أعده وترجمه للغة السنهالية

## شعبة توعية الجاليات بالزلفي

الطبعة الثانية: ١٤٢٢/١

ح شعبة توعية الجاليات بالزلفي ، ١٤٢٠هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

شعبة توعية الجاليات بالزلفي
وسائل الثبات - الزلفي.
٢٤ ص ؛ ١٢ × ١٧ سم
ردمك : ٣ - ٦٧ - ٨١٣ - ٩٩٦٠
(النص باللغة السنهالية)
١ . الوعظ والإرشاد أ. العنوان
ديوي ٢١٣ ٢٠/٢٣١٢

رقم الايداع ٢٠/٢٣١٢
ردمك : ٣ - ٦٧ - ٨١٣ - ٩٩٦٠

الصف والإخراج: **شعبة توعية الجاليات بالزلفي**

# وسائل الثبات

# ස්ථිර පැවැත්ම

## සඳහා

# මග පෙන්වීම්

අල්ලාහ්ගේ මාර්ගයෙහි ස්ථිරව සිටීම, නිහතමානිව හා ස්ථිරව යහ මගෙහි ගමන් කිරීමට අදහස්කරන සෑම සැබෑ මුස්ලිම්වරුන්ගේම අරමුණකි. අල්ලාහ් තආලා මේ බව මෙසේ පවසන්නේය.

{إِنَّ الَّذِيْنَ قَالُوْا رَبُّنَا اللهُ ثُمَّ اسْتَقَامُوْا تَتَنَزَّلُ عَلَيْهِمُ الْمَلاَئِكَةُ أَلاَّ تَخَافُوْا وَلَا تَحْزَنُوْا وَأَبْشِرُوْا بِالْجَنَّةِ الَّتِيْ كُنْتُمْ تُوْعَدُوْنَ. نَحْنُ أَوْلِيَاؤُكُمْ فِي الْحَيَاةِ الدُّنْيَا وَفِي الْآخِرَةِ، وَلَكُمْ فِيْهَا مَا تَشْتَهِيْ أَنْفُسُكُمْ وَلَكُمْ فِيْهَا مَا تَدَّعُوْنَ. نُزُلًا مِّنْ غَفُوْرٍ رَّحِيْمٍ.} (فصلت ٣٠-٣٢)

නියතවශයෙන්ම, කවරෙකු තම දෙවියා අල්ලාහ් බව පවසා (එහි) ස්ථිරව රැඳී සිටින්නේද, දේව දූතවරුන් ඔවුන් කරා පැමිණ, 'ඔබලා නොබියවන්න, ඔබලා කණගාටු නොවන්න, ඔබලාට පොරොන්දුවූ ස්වර්ගය පිළිබඳ සුභාරංචිය ගැන ප්‍රීති වන්න. අපි මෙලෝ ජීවිතයේ හා පරලොවෙහි ඔබලාට උපකාර කරමින් සිටිමු.

තවද ස්වර්ගයේ ඔබ සිත් කැමැතිවන දේ ඔබලාට තිබේ. එහි ඔබ අයැදෙන සියල්ල ඔබලාට ලැබේ. මෙය ඉමහත් සමාව වන්තයාගෙන් හා කරුණා වන්තයාගෙන් ලැබෙන

සංග්‍රහයෙකි. යනුවෙන් පවසති. (41:30-32) තවද අල්ලාහ් මෙසේ පවසන්නේය.

{إِنَّ الَّذِيْنَ قَالُوْا رَبُّنَا اللهُ ثُمَّ اسْتَقَامُوْا فَلاَ خَوْفٌ عَلَيْهِمْ وَلاَهُمْ يَحْزَنُوْنَ. أُولَئِكَ أَصْحَابُ الْجَنَّةِ خَالِدِيْنَ فِيْهَا، جَزَاءً بِمَا كَانُوْا يَعْمَلُوْنَ}

(الأحقاف -١٣، ١٤)

ඇත්තවශයෙන්ම, කවරෙහු තම දෙවියා අල්ලාහ් බව පවසා එහි ස්ථිරව රැඳී සිටින්නේද, ඔවුන්ට (කිසියම්) බියක් නොමැත. ඔවුන් කණගාටුද නොවෙන්නෝය. ඔවුන්තමා ස්වර්ග වැසියන්. ඔවුන් කළ (කුසල්) ක්‍රියාවෙහි කුලිය (ප්‍රතිඵලය) සඳහා එහි සදාකාලිකව සිටිති. (46:13,14)

ධර්මයෙහි ස්ථිර පැවැත්මෙන් සිටීමේදී ලැබෙන පල ප්‍රයෝජනයන් මෙම වැකියේද, වෙනත් වැකිවලද අඩංගුවේ. ඒවායින් සමහර පල ප්‍රයෝජනයන් මෙසේය.

01. අල්ලාහ් සමග ස්ථිර සම්බන්ධ තාවයක්ද, සිතට සැනසීමක්ද, හෘදයට සන්සුන්තාවයක්ද ලැබීම.
ස්ථිර පැවැත්මෙන් සිටින්නා අල්ලාහ් අනිවාර්‍ය කළ කාර්‍යයන් දැනගෙන ඒවා අල්ලාහ් සෑහීමට පත්වන පරිදි ක්‍රියා කරයි.

02. ස්ථිර පැවැත්මෙන් සිටින්නාට අල්ලාහ්ගේ ප්‍රශංසාව ලැබීම.
'කවරෙකු අල්ලාහ් තම දෙවියා බව පවසා එහි ස්ථිරව පවතින්නේද....'(අල් කුර්ආන්) එනම්, කවරෙකු අල්ලාහ් තආලාගේ අණට කීකරුවී, ඔහු පැහැදිලිකළ පරිදි ඔහුට අවනතවී ක්‍රියාකර, ඔහුට මුවින් හා ක්‍රියාවෙන් චිත්ත පාරිශුද්ධිය කරන්නේද.. (යනුවෙන් අල්ලාහ් ප්‍රශංසා කරයි)

03. දේව දූතයන් මවුන්ගේ මරණාසන්න මොහොතේදී මවුන් වෙත පැමිණීම.
තවද, මවුන් මිනීවළෙහි සිට පිටත්වන සමයේ 'ඔබලා කළ පරලොව පිළිබඳ කාර්‍යයන් ගැනද, ඔබලා ලොවෙහි ඇර ආ සම්පත්, දරුවන් හා පවුලයන් ගැනද 'බිය හෝ දුක් නොවන්න' (අල් කුර්ආන්) යනුවෙන් පවසා දේව දූතවරුන් සුභාරංචි පතති.

04. අල්ලාහ් තආලා පොරොන්දු වූ ස්වර්ගය මවුන්ට ලැබෙන බව දේව දූතවරුන් සුභාරංචි පැනීම.
'ඔබලාට පොරොන්දු වූ ස්වර්ගය පිළිබඳ සුභාරංචියෙන් ප්‍රීතිවනු'. (අල් කුර්ආන්)

05. මෙලොවෙහි හා පරලොවෙහි දේව දූතවරුන්ගේ රැක වරණය ලැබීම.
එතුමන් මෙලොවෙහි ඔවුන් පාප ක්‍රියාවෙහි නොයෑදීමට වගබලා යහ මගෙහි යොමු කරති. පරලොවෙහි මවුන් මිනීවළ සිට ස්වර්ගය පිවිසීම දක්වා පිළිගනිති. 'මෙලෝ ජිවිතයෙහි හා පරලොවෙහි අපි ඔබලාගේ භාරකරුවන්ය'. (අල් කුර්ආන්)

06. ස්ථිර පැවැත්මෙන් සිටින්නන්ට අල්ලාහ්ගේ පොරොන්දු ඉටුවීම.
එය, ස්වර්ගයේ මවුන්ගේ සිත් කුමක් ප්‍රිය කරන්නේද, මවුන්ගේ නැත් කුමකට පිනා යන්නේද, මවුන්ගේ දිවන් කුමක් සොයන්නේද ඒ සියල්ල මවුන්ට ලැබෙන බව අල්ලාහ් පොරොන්දුවී සිටී. 'එහි ඔබලාගේ සිත් ප්‍රිය කරන සැම දේ තිබේ. ඔබලා අයැදින සැමදේ ඔබලාට ලැබේ. (අල් කුර්ආන්)

07. ස්ථිර පැවැත්ම.

එය, අල්ලාහ්ගෙන් පසු, මවුන් පාප ක්‍රියාවන්හි හා අයහපත් කාර්‍යයන්හි පිරිහීමෙන්ද, අයහපත් මිනිසුන් සමග ආශ්‍රය කිරීමෙන්ද, ඇඳහීම්හි කම්මැලි වීමෙන්ද වළකා රැකගනී.

මෙම ස්ථිර පැවැත්ම යන මාතෘකාවේ වැදගත්කම විවිධ කාර්‍යයන්හි අඩංගුවේ. ඒවා..

වත්මන් මුස්ලිම් සමාජය පරිහානියට පත්වී තිබේ. ධර්මය නූතනවීමට හේතුවන හිතු මනාපය පරිදි කටයුතු කිරීමද විවිධාකාර සැක කිරීමද සිදුවෙන්නේය. ඒවා පිළිපදින්නන්ද නබි මුහම්මදු (සල්)තුමා පවසන පරිදි නූතන උදාහරණයක් බවට පත්වූහ.

( يَأْتِي عَلَى النَّاسِ زَمَانٌ الْقَابِضُ عَلَى دِيْنِهِ كَالْقَابِضِ عَلَى الْجَمَرِ. )

මිනිසුන් අතර කාලයක් පැමිණේ. (එම කාලයේ) ධර්මය වෙළා ගැනීම ගිනි අඟුර වෙළා ගැනීම සේ පවතී.

පෙර කාලයේ විසූ සහෝදරයන්ට වඩා අද ජීවත්වන මුස්ලිම් වරුන්ට ධර්මයේ ස්ථිර පැවැත්මෙහි අවශ්‍යතාවය වැදගත් යන්නෙහි බුද්ධිමතුන් අතර කිසියම් සැකයන් නොමැත. මෙම ස්ථිර පැවැත්ම තහවුරු කිරීමට අධික වැයම අවශ්‍යයයි. මක්නිසාදයත්, කාලය විනාශවී ඇත. සත්‍ය සහෝදරයන් දුර්ලභවූහ. සහයෝගය දක්වන්නන් අඩුවූහ. උපකාර කරන්නන් අසරණවූහ.

# ස්ථිර පැවැත්මෙහි මාර්ගයන්

අල්ලාහ්තආලා, තම වේද ග්‍රන්ථය මගින්ද, නබිතුමාගේ කියමන් මගින්ද, නබිතුමාගේ ජීවිතය මගින්ද ධර්මයේ ස්ථිර පැවැත්මට අයත් සියලු මාර්ගයන් අපහට පැහැදිලිකර ඇත.

මෙය අල්ලාහ් තආලා අපහට කළ දයාවකි. ඒවායින් සමහර යත් මෙසේය:

## 1-කුර්ආනය කරා ළඟාවීම

අල්කුර්ආනය (ආගමේ) ස්ථිර පැවැත්මෙහි ප්‍රථම මාර්ග යෙකි. කවරෙකු කුර්ආනය වෙළා ගන්නේද අල්ලාහ් ඔහුව ආරක්ෂා කරයි. කවරෙකු එය පිළිපදින්නේද ඔහුව අල්ලාහ් ජයග්‍රහණය කරවයි. කවරෙකු එය කරා කැඳවන්නේද ඔහුට අල්ලාහ් යහ මග පෙන්වයි. මෙම කුර්ආනය ක්‍රමවත්ව හා පැහැදිළිව පහළවීමේ අරමුණ, ස්ථිර පැවැත්ම සඳහා බව අල්ලාහ් පවසන්නේය. කාෆිර්වරුන්ගේ සැක (ප්‍රතික්ෂේප) කිරීමට උත්තරයක් ලෙස අල්ලාහ් මෙසේ පවසන්නේය.

{وَقَالَ الَّذِيْنَ كَفَرُوْا لَوْلاَ نُزِّلَ عَلَيْهِ الْقُرْآنُ جُمْلَةً وَاحِدَةً, كَذَلِكَ لِنُثَبِّتَ بِهِ فُؤَادَكَ وَرَتَّلْنَاهُ تَرْتِيْلاً. وَلاَ يَأْتُوْنَكَ بِمَثَلٍ إِلاَّ جِئْنَاكَ بِالْحَقِّ وَأَحْسَنَ تَفْسِيْرًا }

(الفرقان: ٣٢،٣٣)

තවද, ඔහුට මෙම කුර්ආනය (මුළුමනින්ම) එකට පහළ නොකළේ කුමක් නිසාද? යනුවෙන් කාෆිර්වරුන් අසන්නේය. මෙමගින් ඔබගේ හෘදය ස්ථිර කිරීම සඳහා ක්‍රමක්‍රමයෙන් මෙය පහළ කළෙමු. ඔවුහු ඔබ වෙත කුමන උදාහරණයක් ගෙන ආවද, (එයට වඩා) සත්‍ය හා අලංකාර පැහැදිලි කිරී මක් අපි ඔබට ලබාදී ඇත. (25:32,33)

කුර්ආනය මිනිස් සිතෙහි විශ්වාසය වපුරවන්නේය. අල්ලාහ් තආලා සමග සම්බන්ධතාවය ඇති කිරීම මගින් සිත පවිත්‍ර කරන්නේය. ඉස්ලාමයේ විරෝධීන්වන කාෆිර් හා මුනාෆික් වරුන් ඇතිකරන සැකයන් සඳහා පිළිතුරු දෙන්නේය. මෙනිසා කුර්ආනය ස්ථිර පැවැත්මට අඩිතාලම ලෙස පවතී.

## 2-ආගම වෙළාගැනීම හා කුසල් කිරීම

අල්ලාහ් තආලා මෙසේ පවසන්නේය.

{ يثبت الله الذين آمنوا بالقول الثابت فى الحياة الدنيا وفى الآخرة,

ويضل الله الظالمين ويفعل الله ما يشاء } (إبراهيم :٢٧)

අල්ලාහ්, කවරෙහු විශ්වාස කරන්නේද ඔවුන් මෙලෝ ජීවිත යෙහි හා පරලොවෙහි ස්ථිර වචනය (ලාඉලාහ ඉල්ලල්ලාහ්) මගින් ස්ථිර කරයි. තවද, අපරාධකරුවන් (ඔවුන්ගේ පාප ක්‍රියා මගින්) නොමග යවයි. තවද, අල්ලාහ් තආලා කුමක් සිතන්නේද එය කරයි. (14:27)

අල්ලාහ් (විශ්වාසවන්තයන්ට) ඔවුන්ගේ කුසල් හා කුසල් ක්‍රියාවන් මගින් මෙලොවෙහි හා පරලොවෙහි (මිනීවළෙහි) ස්ථිර පැවත්ම ලබාදෙන බව කතාදා (රලි) තුමා ඇතුලු පෙරැන්නන් පැහැදිළි කරති. තවද, අල්ලාහ් මෙසේ පවසයි.

{ولو أنهم فعلوا ما يوعظون به لكان خيرا لهم وأشد تثبيتا} (النساء : ٦٦)

ඔවුහූ තමන්ට කළ උපදෙස් අනුව ක්‍රියා කරන්නෙහිද, එය ඔවුන්ට යහපත් වශයෙන් හා (සත්‍යයේ) දැඩි ස්ථිර පැවැත්මෙන් පවතී. (4:66)

ඔව් එසේමයි. නොඑසේනම්, ප්‍රශ්නයන් මතුවී කරදරයන් සිදුවනවිට කුසල් ක්‍රියාවන් නොකර කම්මැලිකමින් සිටින්නන් ගෙන් ස්ථිර පැවැත්ම අපහට අපේක්ෂාකළ හැකිද?. එනමුත්, කවරෙහු විශ්වාසකර, කුසල් ක්‍රියා කරන්නේද අල්ලාහ් ඔවුන්ගේ විශ්වාසය මගින් ඔවුන්ට ස්ථිර පැවැත්මෙන් යහමග පෙන්වයි.

මෙනිසා නබි මුහම්මදු (සල්) තුමා අඛණ්ඩව කුසල් ක්‍රියා

වන්හි යෙදී සිටියේය. එතුමා, ස්වල්ප වුවද නොකඩවා කරන ක්‍රියාවන් ප්‍රිය කළේය.

## 3-නබිවරුන්ගේ ඉතිහාසයෙන් ආදර්ශවීම

මෙයට පහත සඳහන් අල්ලාහ්ගේ වැකිය සාදකයක් ලෙස ගත හැක.

{وكلا نقص عليك من أنباء الرسل ما نثبت به فؤادك، وجاءك في هذه الحق وموعظة وذكرى للمؤمنين} (هود : ١٢٠)

(නබිතුමණී) ඔබගේ සිතෙහි ස්ථිර පැවැත්ම සඳහා අප දූත වරුන්ගේ ඉතිහාසය තුලින් සියල්ල අපි ඔබට පවසන්නෙමු. තවද, මෙහි ඔබට සත්‍යතාවය (පිළිබඳ දැනුම) ද, උපදෙස්ද, විශ්වාස වන්තයන්ට සිහි කිරීම්ද තිබේ. (11:120)

මෙවැනි ඉතිහාසයන් පවසන වැකියන් නබි (සල්) තුමාගේ කාලයේ පහළවූයේ රසවිඳීමට හෝ නිශ්ප්‍රයෝජනයට ගැනීමට හෝ නොවේ. නමුත්, එවන් වැකියන් පහළවූයේ නබිතුමාගේ හා මුස්ලිම් වරුන්ගේ සිත් ස්ථිරවීමේ ඉමහත් අරමුණ මුල්කර ගෙනය.

## 4-ප්‍රාර්ථනා කිරීම

ස්ථිර පැවැත්ම ලබාදෙන ලෙස අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කිරීම ඔහුගේ විශ්වසනීය වහලුන්ගේ ගුණාංගයෙකි. (පහත සඳහන් පරිදි ප්‍රාර්ථනා කිරීම සතුටුදායක කරුණෙකි.)

ربنا لا تزغ قلوبنا بعد إذ هديتنا. ربنا أفرغ علينا صبرا وثبت أقدامنا.

රබ්බනා ලා තුසි(ග්)හ් කුලූබනා බඃද ඉද් හදයිතනා. රබ්බනා අෆ්රිග් අලයිනා සබ්රන් ව තබ්බිත් අක්දාමනා.

තේරුම-'දෙවියනේ, ඔබ අප යහමගෙහි යොමු කළායින් පසු අප සිත් යහ මගෙන් නොපෙරළනු මැන. දෙවියනේ, ඔබ අපට ඉවසීම ලබාදෙනු මැන. අප පාදයන් ස්ථිර කරනු මැන. නබි (සල්) තුමා පහත සඳහන් පරිදි අධිකව ප්‍රාර්ථනා කළේය.

يا مقلب القلوب ثبت قلبي على دينك (رواه الترمذى)

යා මුකල්ලිබල් කුලූබ්, තබ්බිත් කල්බී අලා දීනික.

තේරුම- හෘදයන් පෙරළන (පාරිශුද්ධ කරන) දෙවියනේ, අප හෘදයන් ඔබ ධහමෙහි ස්ථිර කරන්වා. (තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)

## 5-අල්ලාහ් සිහිගැන්වීම

සිහිගැන්වීම (භාවනා කිරීම) ස්ථිර පැවැත්මෙහි කාරානා වන් අතර වැදගත් කරුණෙකි. මෙය හෘදයට ආහාරයෙකි. ආත්මාවට ඖෂධයෙකි. භාවනා කිරීම මුස්ලිමෙකුට තමා මැවූ දෙවියා සමග සම්බන්ධතාවය ඇති කෙරේ.

## 6-යහමගෙහි අවධානය යොමුකිරීම

එකම නිවැරදි මාර්ගය පිළිපැදීම සැම මුස්ලිම්වරයෙකුටම අනිවාර්යයයි. මෙය සුන්නත් වල් ජමාඅත්වරුන්ගේද, පැහැදිලි ප්‍රතිපත්තිවාදීන්ගේද මගකි. මෙය නිවැරදි මගකි. මෙය නබි තුමාගේ යහමගද, (අදාළ) සාධකයන්ද පිළිපැදීමක් වන්නේය. ඊමානයේ (විශ්වාසයේ) මූලිකයෙහි ස්ථිරවී ඒ අනුව තම ජීවිතය හා ආත්මය වර්ධනය කළ යුතුයි. එවිට එයට තම සිතෙහි ඉමහත් ස්ථානයක් හිමිවේ. තවද, තම සිතෙහි අල්ලාහ් පිළිබඳ ඔහුටම හිමි ශ්‍රේෂ්ඨය හා ගෞරවය මගින් පැහැදිලි දැනුමක් ලැබේ.

මෙසේම දේව දූතයන් (මලාඉකා) පිළිබඳ විශ්වාසයෙන්ද ස්ථිරයෙන් සිටිය යුතුයි. ඔවුන් අල්ලාහ්ගේ මැවීමකි. අල්ලාහ් තමා ඇදහීම සඳහා ඔවුන් මැව්වේය. අල්ලාහ් මෙසේ පවසයි.

{ يسبحون الليل والنهار لا يفترون} (الأنبياء ٢٠)

ඔවුන් (දේව දූතයන්) වෙහෙස නොවී රෑ හා දහවල් සෑම වේලාවම ඔහුව ප්‍රශංසාකරමින් සිටිති. (21:20)

ඔවුන්ගෙන් මිනිසුන් ආරක්ෂාකරන අයද, කුසල් හා අකුසල් ක්‍රියා සටහන් කරන අයද, ස්වර්ගය හා අපාය භාරකරුවන්ද සිටිති. ඔවුන්ගෙන් වහී (දේව වැකියන්) ගෙනෙන ජිබ්රීල් (අලෛ) තුමා ශ්‍රේෂ්ඨවන්තයාය. මිනිස් සිතෙහි සැනසුම එම වහී මගින්ද සිදුවෙන්නේය. ඔවුන් අතර සූර් යන නළාව පිඹින ඉස්රාෆීල් (අලෛ) තුමාද කෙනෙකි.

එසේම පරලොව පිළිබඳ විශ්වාසයේ ස්ථිරව සිටිය යුතුයි. එහි බිය ජනකය (භයංකරය) සිතට ගත යුතුයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

{ يوم يقوم الناس لرب العالمين } (المطففين ٦)

එදින, විශ්වයේ අධිපතිගේ ඉදිරියෙන් මිනිසුන් සෑම දෙනා නැගිට සිටිති. (83:6) එදින පාප කරුවන්ට හා අහංකාර කරුවන්ට නින්දාකරන දිනයෙකි. එදින නබි මුහම්මදු (සල්) තුමා හැර මිනිසුන් සෑම දෙනා 'මාව රැකගනු, මාව රැකගනු යනුවෙන් පවසති. නබි (සල්) තුමා මිනිසුන් ගැන අල්ලාහ් වෙත ආයාචනා (නිර්දේශ) කරමින් සිටී.

එසේම, වේද ග්‍රන්ථ පිළිබඳ විශ්වාසයේද ස්ථිරව සිටිය යුතුයි. කුර්ආනය, තව්රාතය, ඉන්ජීලය හා සබූරය යන වේද

ග්‍රන්ථ ඉබ්රාහීම් (අලෛ) තුමා හා මූසා (අලෛ) තුමාගේ වේද ආඥාද මෙහි අඩංගුවේ.

එසේම ඉරණම පිළිබඳව හා එහි යහපත, අයහපත, සැප හා දුක යනාදියන් පිළිබඳ විශ්වාසයේද ස්ථිරව සිටිය යුතුයි. එනම්, ලොවෙහි පෙර සිදුවූ හෝ දැනට සිදුවන හෝ පසුව සිදුවෙන්නට යන සියලු දේ අල්ලාහ්ගේ ඉරණම හා තීරණය මත පවතින බවද, අල්ලාහ්ගේ ඉරණමෙන් පිට කිසියම් දෙයක් නොසිදුවන බවද අවබෝධකර එහි ස්ථිරව සිටිය යුතුයි.

ඇත්ත වශයෙන්ම මූලික ප්‍රතිපත්තිය අප සිතෙහි ස්ථිරකර, එහි තේරුම වටහාගෙන සිටින්නේද, එහි ප්‍රතිබිම්බය අප චරිතයෙ පිටවෙන්නේද, එය අප සිතට නව යහපත් ජීවනයක් ලබා දෙන්නේය. මෙම හේතූන් නිසා අපගේ ඇදහීම්, පරලෝ පිළිබඳ සිතුවිල්ලෙන් හා ශ්‍රේෂ්ඨවූ අල්ලාහ්ගේ ඉදිරියේ සිටීමේ හැඟීමෙන් සහිතවූ පලක් ලබා දෙන්නේය. තවද, අකුසල් රැකුල් දෙන, නිරෝගීකම විනාශ කරන හා අගුණ සිතුවිල්ල යන් සොයන ආත්මා සමග සටන් කරන තැනෙහි සිටින බව අපි සිතිය යුතුයි.

## 7-පුහුණුව ලැබීම

විශ්වාසණීය පුහුණුව, චින්තනාත්මක පුහුණුව, ප්‍රබෝධාත් මක පුහුණුව හා ක්‍රමවත් පුහුණුව යන්නන් ස්ථිර පැවැත් මෙහි මූලික කාරනාවන්ය.

### අ).විශ්වාසනීය පුහුණුව

මෙම පුහුණුව, අල්ලාහ් පිළිබඳ බියවීම, ඔහුගේ දයාව අපේක්ෂා කිරීම හා ඔහු ප්‍රිය කිරීම යනාදියන් මගින් සිතට හා හෘදය සාක්ෂියට පුණර් ජීවණයක් ලබා දෙයි.

### ආ). චින්තනා පුහුණුව

මෙම පුහුණුව නිවැරදි සාධකයන් මත රැඳී සිටින අතර, අස්ථිරතා ප්‍රතිපත්තිය හා නිකරුණේ පිළිපැදීම වළක්වයි.

### ඉ). ප්‍රබෝධනා පුහුණුව

මෙම පුහුණුව, අපරාධ කරුවන්ගේ මාර්ගයෙහි නොයා, ඉස්ලාම් විරෝධීන්ගේ සැලැස්ම පිළිබඳව තේරුම ලබාදී, යථාර්තය වටහා දෙයි. තවද, සිදුවන දේ හා සිද්ධීන් පිළිබඳ සත්‍ය තාවයන් මැන බැලීමට සලස්වයි.

### ර්). ක්‍රමවත් පුහුණුව

මෙම පුහුණුව පෙර පිළියෙළ නොවීම, හදිසිවීම හා වැරදි මගෙහි යාම යනාදියෙන් තොර නිවැරදි සැලැස්මෙන් ක්‍රම වත්ව මුස්ලිම්වරයාට ශ්‍රේෂ්ඨ මාර්ගය පෙන්වයි.

ස්ථිර පැවැත්මෙහි මාර්ගයක්වන 'පුහුණුව ලැබීම' යන මගෙහි වැදගත්කම වටහාගැනීම සඳහා නබි (සල්) තුමාගේ ජීවිතය කරා යා යුතුයි. මක්කා කාෆිර්වරුන්ගේ පීඩනයට ලක්වූ නබිතුමාගේ අනුගාමිකයන්ගේ (සහාබා) ස්ථිර පැවැත් මට මූලිකවූයේ කුමක්ද? යනුවෙන් අප හෘදයෙන් විමසා බැලිය යුතුයි. නබිතුමාගේ ගැඹුරු පුහුණුවෙන් තොරව ඔවුන්ට ස්ථිර පැවැත්ම ලැබිය හැකිද?.

නබිතුමාගේ අනුගාමිකයෙක්වූ (ක්)හබ්බාබ් බින් අරත් (රලි) තුමාගේ සිද්ධියක් මෙයට උදාහරණයකි. ඔහු සත්‍යය විශ්වාස කළ නිසා ඔහුගේ හාම්පුතුන්, යකඩය උණුවන තෙක් ගිනියම්කර, එහි ඔහුව නිර්වස්ත්‍රයෙන් ඉසා දැමූහ. එම ගින්න නිවන තරමට ඔහුගේ පිට පැත්තෙන් මේදය උණුවී ගලා ඒමට පටන් ගත්තේය. මේ සියල්ල ඉවසා සිටීමට ඔහුට හේතුවූයේ කුමක්ද?.

මෙසේම බිලාල් (රලි) තුමාව උණුවන වැලි ගොඩෙහි (නිර්වස්ත්‍රයෙන්) තබා ඔහුගේ පපුව මත විශාල ගලක් තැබූහ. සුමෙයා (රලි) තුමිය මාංචු දමා දම්වැල්ලෙන් බැඳ දැමූහ. අපි දකින (ස්ථිර පැවැත්මෙහි) මෙම පුහුණුව නොලැබෙන්නේනම්, ඔවුන්ට මෙසේ ස්ථිරව සිටිය හැකිද?. සිතා බැලීය යුතුයි.

## 8-මග පිළිබඳ ස්ථිරතාවය

මුස්ලිම්වරයෙකුට තමා යන මග පිළිබඳ විශ්වාසය අධික වනවිට, එම මගෙහි ඔහුගේ ස්ථිරතාවය තහවුරු වන බවට කිසියම් සැකයක් නොමැත.

එසේම ගමන් කරන මෙම යහමග, පෙර විසූ වක්තෘ වරුන්, සත්‍යවන්තයන්, ආගමික වියතුන්, පරිත්‍යාගශීලීන් හා යහපත් මිනිසුන් ගිය මග බව හැඟීමෙන් සැළකිය යුතුයි. එවිට මෙම මග හුදෙක්ම තනියෙන් ගමන් කරන මගක් ලෙස සළකන්නේ නැත. එයට අමතරව, අවශ්‍ය සහාය ලැබේ. දුක් සියල්ල සැපට පත්වේ. මක්තිසාදයන්, එම වක්තෘවරුන් හා යහපත් මිනිසුන් මෙම මගෙහි සහෝදරයන් සිටිනවා යන හැඟීමෙන් කටයුතු කළහ.

තවද, (අල්ලාහ්ගේ මැවීම්වලින් අන් සියල්ලනට වඩා) අපව අල්ලාහ් තෝරා, (අපහට ශ්‍රේෂ්ඨත්වයලබාදී) තිබීම යන හැඟීම අවශ්‍යයයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

{قل الحمد لله وسلام على عباده الذين اصطفى} (النمل: ٥٩)

ප්‍රශංසා සියල්ල අල්ලාහ් තආලාට හිමිවේ. තවද, ඔහු තෝරා ගත් ඔහුගේ දාසයන්හට සාමය ලැබෙන සේක්වා. (27:59)

අල්ලාහ් අප ද්‍රව්‍ය පදාර්තයෙක් හෝ සිවුපවෙක් හෝ කාෆිර්

වරයෙක් හෝ (ඉස්ලාමය පිළි නොගත්තා) නූතන (බිද්අා) කාර්යයන් සඳහා කැඳවන්නෙක් හෝ අකීකරුවෙක් හෝ ඉස්ලාම් කෙරෙහි නොකැඳවන මුස්ලිම්වරයෙක් හෝ අසත්‍ය මග කරා කැඳවන්නෙක් හෝ ලෙස මැවුවේනම්, අප හැඟීම් කෙසේ තිබේද?. එසේ නොමැතිව අප සැම මැවීම් වලට වඩා ශ්‍රේෂ්ඨයෙකු ලෙස තෝරා, සුන්නත් වල් ජමාඅතය (යහ මග පිළිපදින සමූහය) ට අයත් කැඳවන්නෙකු ලෙස අල්ලාහ් පත්කර සිටීම යන හැඟීම, අපි අපගේ මගෙහි ස්ථිරව සිටීමේ සාදකයක් නොවේද?. මේ ගැන අපිට සිතීමට නොහැකිද?.

## 9-කැඳවීමෙහි නිරතවීම

ක්‍රියා නොකරන සිත අපවිත්‍රවන්නේය. එබැවින්, සිත ක්‍රියා කිරීමට උතුම් මාර්ගය අල්ලාහ්තආලා කරා කැඳවීම් කිරීමකි. මෙය රසූල් වරුන් (දූත) කළ ස්වයෙකි. අල්ලාහ්ට සිත අවනතවීමෙහි යොමු නොකළේද, එය පාප ක්‍රියාවන්හි යොමු කරයි. ඊමානය නම් විශ්වාසය විටක අධිකවේ. තවත් විටක ඌණවේ.

කැඳවීමේ කාර්යයට ඉමහත් කුලිය තිබෙන හෙයින් එය ස්ථිර පැවැත්මට තුඩුදෙන මාර්ගයෙකි. මක්නිසාදයත්, සටන් කරන්නාට ආරක්ෂාව අවශ්‍ය නොවන්නේය. අල්ලාහ් තආලා කැඳවන්නන් සමග සිටී. ඔහු ඔවුන් තහවුරුකර, ඔවුන්ගේ පාදයන් ස්ථිර කරන්නේය. කැඳවන්නා, තම ඥානයෙන් හා හැකියාවෙන් රෝගයන් සමග සටන් කරන වෛද්‍යවරයෙකුට සමානවන්නෙකුය.

## 10-ස්ථිර පැවැත්ම වෙළා ගැනීම

මෙම ස්ථිර පැවැත්මේ මූලිකයන්හි ස්වභාවය පිළිබඳව නබි තුමා මෙසේ පවසන්නේය.

(إن من الناس ناسا مفاتيح للخير مغاليق للشر) رواه إبن ماجه

මිනිසුන්ගෙන් සමහරුන් කුසල් ක්‍රියාවන්හි යතුරු ලෙසද, අකුසල් ක්‍රියාවන්හි යතුරු තහඩු (ඉබ්බන්) ලෙසද සිටිති. (ඉබ්නු මාජා ග්‍රන්ථය ඇසුරෙනි)

එබැවින්, ආගමික වියතුන්, යහපත්ශීලීන් හා කැඳවීමෙහි නිරතවී සිටින විශ්වාසවන්තයන් සොයා යාම හා මවුන් වෙළා ගැනීම ස්ථිර පැවැත්මට ඉමහත් උපකාරයෙකි.

මෙහි ඉස්ලාමීය සහෝදරත්වය ස්ථිර පැවැත්මට මූලික ස්ථානයක් වශයෙන් පවතී. එවිට යහපත් සහෝදරයන්, ආදර්ශ වන්තයන් හා තමා රකින්නන් මගෙහි උපකාරයන් ලෙසද, මග පෙන්වන්නන් ලෙසද සිටිති. එමෙන්ම මවුහු අල්කුර්ආනයේ වැකියන් හා තම බුද්ධිය මගින් ස්ථිර පැවැත් මෙහි තහවුරු කරති. එනිසා මවුන් සමග එක්ව සමූහයෙන් ජීවත්විය යුතුයි. වෙන්වී තනිවම ජීවත්විය නොයුතුයි. එවිට ෂෛතාන්වරුන් (යක්ෂයන්) නොමග යවති.

නිශ්චයෙන්ම වෘකයා තනිවම සිටින එළුවාව ග්‍රහණය කරයි. තමන් යහපත්ව සිටින අතර, අන් අයද යහපත් මගට යොමුකරන යහපත්ශීලීන් මිත්‍රයන් ලෙස ලබාගැනීම ස්ථිර පැවැත්මට ඉමහත් දායකත්වයෙකි. මක්නිසාදයත්, මෙවැනි මිත්‍රයන් තම සහෝදරයාට, අල්ලාහ්ට අවනතවීම සඳහා හා අධ්‍යාපනය ලබාගැනීම සඳහා උපකාර කරති. ඔහුගේ වැඳුම් පිදුම් වලදීද ඔහුගේ චරිතයෙහිද සිදුවන වැරදි පෙන්වා දෙයි.

## 11-අල්ලාහ්ගේ උපකාරය

අල්ලාහ් තආලාගේ උපකාරයද, අනාගතය ඉස්ලාම් ධර්මය වෙද බව ස්ථිරව විශ්වාස කිරීම අවශ්‍යයයි.

## 12-අසත්‍ය හා රැවටීම

අසත්‍යභාවයේ යථාර්තය දැනගැනීම හා එමගින් රැවටීමෙන් වැළෙක්වීම අවශ්‍යයයි. මේ පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

{ لا يغرنك تقلب الذين كفروا في البلاد } (آل عمران : ١٩٦)

(නබිතුමනී) කාෆිර්වරුන් නගරයෙන්හි විනෝදයෙන් ගැවසීම ඔබව නොරවටත්වා. (3:196)

## 13-ගුණාංගයන් වර්ධනය කිරීම

ස්ථිර පැවැත්මට උපකාරවන ගුණාංගයන් වර්ධනය කිරීම අවශ්‍යයයි. මෙයින් මූලිකව පවතින්නේ ඉවසීමෙකි. මේ ගැන නබි (සල්) තුමා මෙසේ පවසන්නේය.

(ماأعطى أحد عطاء خيرا من الصبر) رواه البخاري ومسلم

ඉවසීමට වඩා උතුම්වූ විශාලම දායාදයක් කවරෙකුට හෝ නොදෙන ලදී. *(බුහාරි, මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

## 14-යහපතුන්ගේ උපදෙස් ලබාගැනීම

යහපත් ශීලීන්ගෙන් උපදෙස් ලබා ගැනීමට උනන්දුවිය යුතුයි. එසේ ලැබෙන උපදෙස් කෙරෙහි නුවන ඇතුව ක්‍රියා කළද යුතුයි. ගමනක යෙදීමට පෙර, එම ගමනෙහි කිසියම් බාධාවන් සිදුවෙයි යනුවෙන් බිය වන්නේද ඒ ගැන උපදෙස් ලබාගත යුතුයි. ප්‍රශ්නයක් මතුවන විට හෝ ප්‍රශ්නය මතු වෙන්නට පෙර ඒ පිළිබඳ උපදෙස් ලබාගත යුතුයි. යම් තනතුරක් සඳහා පත්වෙන්නේද හෝ හිමිකමින් සම්පතක් හා මුදල් සම්භාරයක් ලැබෙන්නේද එවිටද යහපතුන්ගේ උපදෙස්

පැතිය යුතුයි. තම ආත්මාවද අන් අයද ස්ථිර කළ යුතුයි. අල්ලාහ් මු:මින්වරුන්ට ආරක්ෂකයා ලෙස සිටින්නාය.

## 15-ස්වර්ගය, අපාය හා මරණය සිහිකිරීම

ස්වර්ගයෙහි භාග්‍යයන් හා අපායයෙහි වේදනාවන් පිළිබඳව සිතීමද, මරණය සිහිකිරීමද අවශ්‍යවේ. ස්වර්ගය ප්‍රීතිවන ස්ථානයෙකි. විශ්වාස වන්තයන්ගේ ගමනෙහි අවසාන මායිමෙකි. මිනිසුන්ගේ සිත්, පරිත්‍යාග කිරීමෙන්ද, කුසල් ක්‍රියාවෙහි යෙදීමෙන්ද ස්ථිරවීමෙන්ද වැළකී සිටීමේ ස්වභාව යෙන් යුත්තෙකි. නමුත්, මෙවැන්නන් කිරීමෙන් මගෙහි සිදුවන දුෂ්කරතා හා අසීරුතා සරලවීමේ අපේක්ෂාව තිබෙන් නේද එම ස්වභාවය යහපත්වේ.

කවරෙකුට ක්‍රියාවන්හි කුලිය පිළිබඳ දැනුමක් තිබේද, ඔහුට එම ක්‍රියාවන්හි තිබෙන අසීරුතාවන් සරලවේ. ඔහු අඛණ්ඩව මෙම ක්‍රියාවන්හි නිරතවේ. මෙහි ස්ථිර පැවැත් මෙන් නොසිටින්නේද, අහස හා පොළොව විශාලමත් ස්වර්ගය නොලැබෙන බව ඔහු වටහා ගනී.

එසේම, මරණය සිහි කිරීම මුස්ලිම්වරයෙකු ආගම සිට ලිස්සා යාමෙන් වළක්වයි. ඔහුව අල්ලාහ් නියමකළ සීමාවෙහි ස්ථිර කරයි. එබැවින්, ඔහු එම සීමාව උල්ලංගනය නොකරයි. කුමක්නිසාදයත්, ඔහු තම අවසාන වේලාව තප්පරයෙකින් පැමිණෙන බව දැනගන්නේද, ආගමෙන් සිට ඔහු ලිස්සා යාමට හෝ අසත්‍යයෙහි මුරන්ඩුවෙන් සිටීමට හෝ ඔහුගේ සිත කෙසේ උනන්දු කරයිද?. එනිසා තමා නබි (සල්) තුමා මෙසේ පවසන්නේය.

( أكثرو من ذكر هاذم الذات ) رواه الترمذي

ආස්වාදයන් නිශ්ඵල කරන මරණය, අධික අධිකයෙන් සිහි කරන්න. (තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)

# ස්ථිර පැවැත්මෙහි අවස්ථාවන්

## 1-කරදරයෙහි ස්ථිරවීම

මිනිසුන්ට සිදුවන කරදරයන් ඔවුන්ගේ සිත්වල සිදුවන පෙරලීම්වලට හේතුවන්නේය. කවරෙහුගේ සිත් සැප හා දුක් වැනි දේ මුහුණපානවිට ඔවුන්ගේ සිත්හි ඊමාන් (විශ්වාසය) පිරිහී තිබෙන්නේද, එවැනි ඉවසිලිවන්තයන් හට ස්ථිර පැවැත්මෙන් සිටිය හැක.

### අ) සම්පත් හා තිලතල

සම්පත් හා තිලතල පිළිබඳ කරදරයන්හි බාධකය ගැන නබිතුමා මෙසේ පවසන්නේය.

(ما ذئبان جائعان أرسلاَ في غنم بأفسد لها من حرص المرء على المال والشرف لدينه) رواه أحمد

මිනිසෙකු ධනයට හා තිලතලයට තණ්හාව කිරීම, එළුවන් කරා එවනලද කුසගින්නෙන් සිටින වෘකයන් දෙදෙනාට වඩා තම ආගමට ඉමහත් විනාශය ගෙනදේ. (අහ්මද් ග්‍රන්ථය ඇසුරෙනි)

### ආ) බිරිඳ හා දරුවන්

බිරිඳ හා දරුවන්ගෙන් කරදරයන් හා විරෝධතාවයන් තිබෙන බව අල්ලාහ් තආලා මෙසේ පවසන්නේය.

{ياأ يها الذين آمنوا إن من أزواجكم وأولآدكم عدوا لكم فاحذروهم}

(التغابن: ١٤)

විශ්වාස වන්තයෙනි, නියතවශයෙන්ම, ඔබලාගේ බිරිඳන් හා දරුවන් අතර ඔබලාට විරෝධීන්ද සිටිති. එබැවින්, ඔවුන් පිළිබඳව අවධානයෙන් සිටිනු. (64:14)

ඉ) නින්දාව, අක්‍රමිකතාවය හා දුෂ්ටකම

ඊ) දජ්ජාල්ගේ කරදරය

## 2-ජිහාදයෙහි ස්ථිරවීම

## 3-සැළසුමෙහි ස්ථිරවීම

## 4-මරණ අවස්ථාවෙහි ස්ථිරවීම

කාෆිර්වරුන්ට හා පාපකරුවන්ට කරදරයන් පිරිවරමින් සිටින දුෂ්කර අවස්ථාවන්හි ස්ථිර පැවැත්ම නොලැබෙන්නේය. එනිසා මරණය සිදුවන අවස්ථාවේ ඔවුන් සාක්ෂි දැරීමේ ඒකත්ව වැකිය (කලිමාව) කීමට අපොහොසත් වෙති. මෙය අසතුටුදායක අවසානයෙකි. මන්දයත්, මෙවැනි මිනිසෙකුට ඔහුගේ මරණ අවස්ථාවේ 'ලාඉලාහ ඉල්ලල්ලාහ්' යන වැකිය කියන ලෙස පැවැසුවිට ඔහු තම සිරස වමට හා දකුණට සොලවනවා මිස මෙම වැකිය පැවැසීමෙන් වැළකී සිටී. තවත් කෙනෙක් ඔහුගේ මරණ අවස්ථාවේ 'මෙය හොඳ දෙයක්. මෙය ලාභෙට ගත හැක යනුවෙන් පවසයි. තුන්වැන්නා එම අවස්ථාවේ චෙස් ඉත්තන්ගේ නම් මතක් කරයි. සතරවැන්නා රාගයන් තාලය කරයි හෝ ගීත වැකියන් ගායනා කරයි. හෝ තම පැම්වතිය සිහි කරයි.

මෙම කාර්‍යයන්, ඔවුන් ලොවෙහි අල්ලාහ් සිහි කිරීමෙන් වැළකීය. මෙවැන්නන් පණ පිටවන අවස්ථාවේ පිළිකුල් මුහුණුවරයකින් හෝ දුගඳ පිරිවරමින් හෝ කිබ්ලා දිසාවෙන් හැරමින් හෝ සිටිති. අල්ලාහ් අප සැම දෙනා රැකගත යුතුයි.

නමුත්, නබිතුමාගේ මග පිළිපැදූ යහපත්ශීලීන්ට අල්ලාහ් ඔවුන්ගේ මරණ සමයේ ස්ථිර පැවැත්මෙහි භාග්‍ය ලබා දෙයි. ඒ අනුව මවුහූ එම ඡහාදා වැකිය පවසති. පණ පිටත්වන අවස්ථාවේ ඔවුන් දීප්තිමත් මුහුණුවරකින් හෝ මිහිරි සුවඳ පිරිවරමින් හෝ ප්‍රීතියෙන් සිටිති.

## තව්බා (පාප ප්‍රහාණය) කිරීම

ආගමික වියතුන්වරුන්, අල්කුරානයෙන් හා හදීසයෙන් උපුටාගත්, පාප ප්‍රහාණය (පව් සමාව) කිරීමේ කොන්දේසියන් පැහැදිලි කරති. ඒවායින් සමහරයන් මෙසේය.

01-තමා කළ පාපා කාර්‍යයෙන් සිට වහාම ඉවත්වීම.

02-තමා විසින් සිදුවූ එම පාප කාර්‍යයන් ගැන කණගාටුවීම.

03-මින් ඉදිරියට මෙවැනි පාප කාර්‍යයන් නොකරන බවට ස්ථිරවීම.

04-තමා විසින් තින්දාවට ලක්වූ අයගේ අයිතිවාසිකම ආපසු ලබාදීම හෝ ඔහුන්ගෙන් එයට නිදහස ලබාගැනීම.

පාරිශුද්ධියෙන් පාප ප්‍රහාණය අයැදීමේ කොන්දේසියට අයත් යම් පැහැදිලි කිරීමක් ආගමික වියතුන් පවසති. ඒවා උදාහරණ සමඟ මෙසේය.

01-පාප කාර්‍යවලින් ඉවත්වීම අල්ලාහ් වෙනුවෙන් පමණක් විය යුතුයි. වෙනත් කිසියම් දෙයක් සඳහා හෝ නොවිය යුතුයි. උදාහරණය වශයෙන් එම පාප කාර්‍යය කිරීමට ශක්තිය නොවීම හෝ එය අඛණ්ඩව කිරීමට නොහැකිවීම හෝ මිනිසුන්ගේ කියමන්වලට බියවීම සඳහා හෝ නොවිය යුතුයි.

තමා දරන නිලතලයට හෝ මිනිසුන් අතර තමාට ඇති ගෞරවයයට හානියක් ලෙස පැවතීම හෝ තම නිලතල

යෙන් ඉවත් කිරීමට හැක යනාදී හේතුන් මුල්කරගෙන කෙනෙකු පාප ක්‍රියාවෙන් ඉවත්වෙන්නේද ඔහු තව්බා (පාප සමාව) අයැද කෙනෙකු නොවන්නේය.

එසේම, තම ආරෝග්‍යභාවය හා ශක්තිය ආරක්ෂාකර ගැනීම සඳහා පවෙන් මිදෙන්නේද, ඔහු තව්බා අයැදූ බව නොසැළකේ. උදාහරණයක් වශයෙන් කෙනෙකු තමාට කෲර රෝගයන් ඇතිවේ හෝ තම දේහය අසරණවී තම චින්තන ශක්තිය දුර්වලවේ යන හේතුන් නිසා 'සිනා' (අනියම් ආශ්වාදය) හා පාප කාර්‍යයන් අතහැරීම.

කෙනෙකු සොරකම් කිරීම සඳහා නිවසතුල පිවිසීමට මගක් නොවීම, අල්මාරිය විවෘත කිරීමට ශක්තිය නොවීම හා මුරකාරයාට හෝ පොලීසියට බියවීම යනාදී හේතුන් මත සොරකම් කිරීමෙන් වැළකී සිටින්නේද ඔහු තව්බා අයැද කෙනෙකු නොවන්නේය. අල්ලස දෙන්නා අල්ලස් දූෂන මර්ධනය කිරීමේ ආයතනයේ අයෙකුවේද යන බියෙන් එයින් වැළකී සිටින්නේද ඔහුද තව්බා අයැද අයෙකු ලෙස නොසැළකේ.

තමා බංගලොත්වේයිද යන බියෙන් රා හා මත්පැන් වර්ග භාවිතා කිරීමෙන් වැළකී සිටින්නාද තව්බා අයැදෙකු නොවන්නේය. එනමුත්, තමා කළ මෙවැනි පාප ක්‍රියාවන් සඳහා අධිකව කණගාටුවිය යුතුයි. තවද, ඉදිරියේදී පාප කාර්‍යයන් කිරීමට ආශාවීමෙන්ද, එවන් පාපයන් කිරීමට නොහැකිවීම ගැන කණගාටු නොවීමෙන්ද වැළකී සිටිය යුතුයි. මෙනිසා 'කණගාටුවීම පව් අයැදීමකි' යනුවෙන් නබිතුමා පැවැසීය (අහ්මද් හා ඉබ්නු මාජා ග්‍රන්ථ ඇසුරෙනි)

02. තමා කළ පාප කාර්‍යයන් කෙතරම් නින්දිත හා දූෂිතය බව වටහා ගත යුතුයි. එනම්, තව්බාවෙහි යෙදීමේදී

අතපසුවූ පාප කාර්‍යයන් සිහිවන විට ප්‍රීතිවී රස විඳින්නේද හෝ අනාගතයේ මෙවැනි පාප කාර්යයන් කිරීමට ප්‍රිය වන්නේනද එය නිවැරදි තව්බාවක් (සමාව අයැදීමක්) නොවන්නේය.

03. තමා කළ පාප කාර්‍යයන් සඳහා තව්බා කිරීමට සීග්‍ර විය යුතුයි. එය ප්‍රමාද කිරීම තවත් පවකී. පසුව එයටද තව්බා වක් කළ යුතුවේ.

04. පවක් සිදුවූ ස්ථානයෙහි රැඳී සිටිනවිට නැවත වරක් පවක යෙදීමට හැකිවේ යනුවෙන් සිතන්නේද, එම ස්ථානයෙන් වැළකී සිටිය යුතුයි.

05. පාප කාර්‍යයන් කෙරෙහි උපකාර කරන්නන්ගෙන් වැළකී සිටිය යුතුයි. මක්නිසාදයත්, පැරණි මිත්‍රයන් සමග නැවත සම්බන්ධතාවය ගොඩනැංවීම මගින් සමහරුන් පාප කාර්‍ය යන් කරා නැවත පිවිසෙන අවස්ථා ගණනාවක් තිබේ.

06. තමා සතුව තිබෙන මත්පැන් ද්‍රව්‍යයන්, වාදක භාණ්ඩ වැනි විනෝද භාණ්ඩයන්, තහනම් ජායා රූපයන් සහ පිළිමයන් හා අසභ්‍ය පොත්පත් යනාදියන් කඩාදමා හෝ ගිනිතබා හෝ විනාශකළ යුතුයි. මක්නිසාදයත්, තව්බා අයැදූ අය සතුව මෙවැනි තහනම් දේ රැඳී තිබීමෙන් ඔවුන් තව්බාවෙන් සිට හැරී ආපසු පාප කාර්‍යයන් කිරීමටත්, යහමග ලැබීමෙන් පසු අයහ මග යාමටත් හේතුවූ සිදුවීම් කීපයක් ඇත. අල්ලාහ් තආලා අප සැමට ස්ථිර පැවැත්ම ලබා දෙනු මැන.

07. අකීකරු මිත්‍රයන් වෙනුවට තමාට උපකාර කරන යහපත් මිත්‍රයන් තෝරා ගත යුතුයි. එසේම සෛතාන්, අතීතයේ තම සිදුවීම් පිළිබඳව සිහිකර දීමට අවස්ථා නොසලසන

පරිදි, දික්රු (භාවනා) කරන හා ආගමික අධ්‍යාපනය ලැබෙන ස්ථානවල රැඳී සිට තම වටිනා කාලය ප්‍රයෝජන වත් ලෙස ගත කිරීමට උනන්දුවිය යුතුයි.

යා අල්ලාහ්, අප සැමට සැම කාර්‍යයන්හි ස්ථිරතාවයද, යහ මගෙහි නිශ්චයතාවයද ලබා දෙනු මැන.

وآخر دعوانا أن الحمد لله رب العالمين.

# وسائل الثبات

سنهالي

ردمك ٢-٦٧-٨١٢-٩٩٦٠

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بسلطانة
تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد
THE COOPERATIVE OFFICE FOR CALL & FOREIGNERS GUIDANCE AT SULTANAH